# මගේ ලෝකය

## ඇසෙන දැනෙන දේ..
## හිතට වැදෙන දේ..



ජගත් ජේ එදිරිසිංහ

ස්ටීවන් මාමා ගේ නිවසේ පිටුපස බිත්තිය වැසෙන සේ එල්ලද ලද විශාල රෙද්දකි. මාමා ඒ මත පැන්සලයකින් අඳිමින් සිටියි. ඔහුගේ අතේ ඇත්තේ ජීවරාණි කුරුකුලසූරිය ගේ ඉතා කුඩා කලු සුදු සේයාරුවකි. (මේ කියන කාලයේ වර්ණ සේයා රූ තිබුණේ නැත) මාමා අතින් කැන්වසය මත ඇඳෙන්නේ ඒ කුඩා සේයාරුවේ සිටින නිළියගෙ දැවැන්ත රූපයකි. සිනමාපටයක ප්‍රචාරක දැන්වීමකි. මේ "කටවුට්" එක කුමන සිනමා පටය සඳහාදැයි දැන් මට මතක නැත. නොයෙකුත් සිනමා පට සඳහා මාමා අතින් මෙවැනි කටවුට් විශාල සංඛ්‍යාවක් ඇඳුණ බව පමණක් මට මතක ය.

කලු සුදු සේයාරුවක් දැවැන්ත සිත්තමකට පෙරළී වර්ණ ගැන්වී නිමවන සිනමා කටවුට් එකක් මට ගෙන දුන්නේ මහත් සතුටකි. අති දක්ෂ චිත්‍ර ශිල්පියකු වූ මාමා නිසි වර්ණ භාවිතයෙන් මේ නලු නිළි රූප වලට ජීවය දෙන අන්දම මට ආශ්චර්යයක් විය. සමහර සිනමා පට සඳහා දුර්වල චිත්‍ර ශිල්පීන් විසින් අඳින ලද ගැඹුරක් නැති පැතැලි කටවුට් දකින විට මට මාමාගේ අගය වඩාත් දැනුණි.

මහගම සේකර ශූරීන්ගේ තුං මං හන්දියේ ලොකු මාමා අතින් හැඩ වන කලා නිර්මාණයනට වශී වූ සිරිසේන සේ මම මාමා අතින් නිමවන සිත්තම දෙස බලා සිටිමි. ඔහු අනුකරණය කරන්නට ඔහු සේම අඳින්නට මට ඇවැසි ය. සේයාරුවක් ලොකු කර අඳින හැටි ඔහු මට කියා දෙයි.


නිවැරදි ආකාරයට සේයාරුවක් විශාල කරන්නට නම් ඒ සේයාරුවේ සියුම් කොටස් - විශේෂයෙන් මුහුණ - නිසි ලෙස විශාලණය කළ යුතු ය. ඒ සඳහා මාමා කුඩා සේයාරුවේ මුහුණ මත අඟල් දශමයක දිග පළල ඇති කොටු ගසා ගනියි. ඒ සෑම ඉරක් සඳහාම අංකයක් දමා ඇත. දහ ගුණයක් විශාල කරන්නට නම් කැන්වසය මත අඟලේ කොටු ගසා ගත යුතුය. ඒ කොටුද මුල් සේයාරුවේ ගැසූ කොටු සේම අංකණය කළ යුතු ය. දැන් මුල් සේයාරුවේ එක එක කොටුවේ ඇති සියුම් තැන් කොටුවෙන් කොටුව කැන්වසය මත ඇති කොටු තුළ ඇඳිය යුතු ය.

වැටෙන් පැන ගෙදර යන මට මාමා අනුකරණය කරමින් සේයාරුවක් විශාලනය කරන්නට සිතෙයි. සෑම මාසයකම තාත්තාට වියට්නාම් තානාපති කාර්යාලයෙන් "වියට්නාම්" ඉංගිරිසි සඟරාව තැපෑලෙන් ලැබෙයි. මේ ඇමරිකන් හමුදාව වියට්නාමය ආක්‍රමණය කර මහා විනාශයක් සිදුකරමින් සිටි කාලයයි. වියට්නාම් සඟරාවේ සුන්දර වියට්නාම් යුවතියකගේ සේයාරුව මත මම කොටු අඳිමි. මගේ විශාල චිත්‍ර පොත මත මම ඇගේ රුව ප්‍රති නිර්මාණය කරමි. මට මහත් සතුටක් දැනෙයි. එනමුදු මගේ හපන්කම මාමාට පෙන්වන්නට ලැජ්ජා සිතෙයි. එය මගේ අනෙක් නිර්මාණ සේ ම මගේ මේස ලාච්චුවේ සඟවා තබමි.

උපාලි අත්තනායක ප්‍රධාන චරිතය රඟපෑ කේ ඒ ඩබ්ලිව් පෙරේරා ගේ "ආදර රත්නේ" චිත්‍රපටයේ නාමාවලිය මාමා අතින් ඇඳෙනු බලා සිටි හැටි මට තවමත් මතකය. සිනමා පටයේ නාමාවලියේ ඇත්තේ කලුලෑල්ලක් මත නලු නිලියන්ගේ කාර්මික ශිල්පීන්ගේ නම් වැටෙන ආකාරයයි. සිනමා පටයේ උපාලි අත්තනායක රඟපෑවේ ගුරුවරයකුගේ චරිතය වූ බැවින් එසේ කරන්නැයි අධ්‍යක්ෂවරයා තමාට බල කළ බව මාමා කීවේ කණගාටුවෙනි. ඔහු මුලින් ඇන්ද නාමාවලිය අධ්‍යක්ෂවරයා විසින් ප්‍රතික්ෂේප කරනු ලැබ තිබුණි. මේ දෙවෙනුවට ඇන්ද නාමාවලිය කිසිදු කලාත්මක බවක් නැති පැතලි නාමාවලියක් විය. මාමා කණගාටුවට පත්ව සිටියේ එනිසා ය.

මාමා ගේ චිත්‍රකලා ගුරුවරයා ජී ඇස් ප්‍රනාන්දු බව මම අසා ඇත්තෙමි. මට චිත්‍ර ශිල්පය උගන්වන්නට මාමා තුළ කැමැත්තක් විය. වරින් වර විරසක වෙමින් සිටි වැඩිහිටියන් නිසා මගේ චිත්‍ර පාඩම දෙවතාවක්ම නැවතුණි. දෙවන වතාවේ නැවතුනේ සදහටම ය. විරසකව නොසිටි කාල වකවානු තුළ ඔහුගේ කලා කටයුතු සඳහා මා ළං කර ගන්නට ඔහු ගේ සිතේ වූ කැමැත්ත මම දුටුවෙමි. එක් වතාවකදී එක්තරා ආගමිකස්ථානයක් වෙනුවෙන් ඔහු කැන්වස් මත අඳිමින් සිටි දේව රූප අතරින්




එක් විශ්ණු රූපයක් ඇඳ වර්ණ ගන්වන්නට මට දීමෙන් ඔහු මා කෙරෙහි වූ විශ්වාසය ප්‍රදර්ශණය කළ හැටි තවම මතක ය.

ලයනල් ගුණතිලක මාමා "ශ්‍රී සංඝබෝධි" නාට්‍යය ප්‍රසිද්ධ වේදිකාවට ගෙනවුත් වසර ගණනාවකට පසු ඒ නාට්‍යය වෙනුවෙන් ස්ටීවන් මාමා අඳින ලද දැවැන්ත පසු තල දර්ශන යොදා ගනිමින් ඇඹුල්දෙනිය හන්දියේ දැවැන්ත වේදිකාවක් තනා "දිට්ඨමංගලිකා" නමින් වෙසක් නාට්‍යයක් කළ හැටි මගේ මතකයට එයි. "දිට්ඨමංගලිකා" නාට්‍යයේ නලු නිලියන් වෙස් ගැන්වීමේ කටයුත්තේ දී මාමා ගේ හවුල් කාරයා වූයේ මා ය. නාට්‍යයේ නැටුම් දර්ශන වල පෙනී සිටි මගේ සම වයසේ දැරිවියනගේ තොල් පෙති වර්ණ ගන්වන්නට මාමා මට බාර දුන් අවස්ථාවේ උපතින්ම මහා ලජ්ජාකාරයකු වූ මා පත්වූ අපහසුව ගැන ලියන්නට වචන අදත් නැත.

මාමාට ස්ථිර රැකියාවක් තිබුණේ නැත. තුං මං හන්දියේ ලොකු මාමා මෙන්ම අපේ මාමා ද මුදල් අගහිඟ කම් වලින් පෙළුණෝ ය. ඒ තමා දැන උගත් කලාව ව්‍යාපාරයක් සේ කරගෙන යන ආකාරය ඔහු නොදැන සිටි නිසා ය. එය ඒ යුගයේ සියලුම සැබෑ කලාකාරයන්ගේ හැටි ය. සිනමා කලා අධ්‍යක්ෂ වරයකු ලෙස ඔහු බොහෝ සිනමාපට වලට සම්බන්ධව සිටියේ ය. ඇල් ඇම් පෙරේරා මහතා ගේ සියලුම සිනමා පට වලත් කේ ඒ ඩබ්ලිව් පෙරේරා මහතා ගේ බොහෝ සිනමා පට වලත් කලා අධ්‍යක්ෂ වරයා වූයේ ඔහු ය. "කලා අධ්‍යක්ෂ - ස්ටීවන් ගුණතිලක" ලෙස අදත් පැරණි සිනමා පටයක නාමාවලියේ ඔහුගේ නම දකින විට මගේ ඇසට කඳුලක් නැගෙයි.

මාමාගෙන් මට ගන්නට බොහෝ දේ තිබුණි. එහෙත් ලබාගන්නට හැකිවූයේ දෝතින් ගත හැකි තරම් කුඩා ප්‍රමාණයකි. ඔහුගෙන් ලබාගන්නට නොහැකි වූ ඒවා මගේ ජීවිතයේ අතහැරුණු බොහෝ දේ අතර ඉදිරියෙන්ම තිබෙයි.

ජීවන ගමනේදී අතහැරෙන මගහැරෙන බොහෝ දේ දෙස උපේක්ෂාවෙන් බලන මට මාමාගෙන් ලබා ගත හැකිව තිබූ නමුදු මට ලබාගත නොහැකි වූ දේ පිළිබඳව ඇත්තේ කණගාටුවකි. ඒ ඔහු වැනි දක්ෂයන් බිහිවන්නේ කලාතුරකින් බව මා දන්නා නිසා ය.

***මාමාට ස්ථිර රැකියාවක් තිබුණේ නැත. තුං මං හන්දියේ ලොකු මාමා මෙන්ම අපේ මාමා ද මුදල් අගහිඟ කම් වලින් පෙළුණෝ ය. ඒ තමා දැන උගත් කලාව ව්‍යාපාරයක් සේ කරගෙන යන ආකාරය ඔහු නොදැන සිටි නිසා ය. එය ඒ යුගයේ සියලුම සැබෑ කලාකාරයන්ගේ හැටි ය. සිනමා කලා අධ්‍යක්ෂ වරයකු ලෙස ඔහු බොහෝ සිනමාපට වලට සම්බන්ධව සිටියේ ය. ඇල් ඇම් පෙරේරා මහතා ගේ සියලුම සිනමා පට වලත් කේ ඒ ඩබ්ලිව් පෙරේරා මහතා ගේ බොහෝ සිනමා පට වලත් කලා අධ්‍යක්ෂ වරයා වූයේ ඔහු ය. "කලා අධ්‍යක්ෂ - ස්ටීවන් ගුණතිලක" ලෙස අදත් පැරණි සිනමා පටයක නාමාවලියේ ඔහුගේ නම දකින විට මගේ ඇසට කඳුලක් නැගෙයි.***



සුරක්නා 2008 විවිධ ප්‍රසංගය විලාසිතා හා මනාලියන් දැක්ම සැප්තැම්බර් 27 වෙනිදා සවස 7.00 සිට Hampton Park Arthur Wren Community ශාලාවේදී පැවැත්වේ.
සංගීතය B SHARP - MEL REF 96 F 8